අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

පිරිවෙන් අධ්‍යාපන අංශය
பிரிவெனாக்கள் கல்வி பிரிவு
Division of Piriven Education

4 වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / 4 வது மாடி, இசுருபாய, பத்தரமுல்ல, இலங்கை / 4th Floor,Isurupaya, Battaramulla, Sri Lanka
☎ +9411 278 5141 / +9411 278 4910 / +9411 278 4893 / +9411 278 4461 +9411 278 5617 / +9411 278 4992 info@piriven.gov.lk www.piriven.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Number | ED/ST/BUD/8/2/2/1/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2023.03.14 |

සියලු ම පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේලා,
කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේලා වෙත.

**<u>2022 (2023) අවසාන වාර පරීක්ෂණ කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධයෙනි.</u>**

මූලික පිරිවෙන්, මහ පිරිවෙන් හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවල 2022 (2023) වර්ෂයේ අවසාන වාර පරීක්ෂණය පිරිවෙන් අධ්‍යාපන අංශය මගින් ලබා දී ඇති කාල සටහනට අනුව නියමිත දිනවල දී ම පැවැත්විය යුතු ය. ඉදිරි දිනවල විභාගය නො පැවැත්වීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැති අතර 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතෙහි විධි විධාන ප්‍රකාර ව සියලු පිරිවෙන්වලට අදාළ ව පිරිවෙන් අධ්‍යාපන අංශය මගින් ලබා දෙන තීරණ ක්‍රියාත්මක කිරීමේ බලය කෘත්‍යාධිකාරීන් වහන්සේලා සතු බව දැඩි ව අවධාරණය කරමි. ඒ අනුව ලබා දී ඇති කාල සටහනට අනුකූල වන පරිදි වාර පරීක්ෂණ කටයුතු විධිමත් ව පැවැත්වීම සියලු ම පිරිවෙන්වල කෘත්‍යාධිකාරී / පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලාගේ වගකීම වේ.

02. මේ සම්බන්ධයෙන් සියලු ම මූලික පිරිවෙන්, මහ පිරිවෙන් හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනවල කෘත්‍යාධිකාරී, පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා සහ ආයතනාධිපති සීලමාතාවන් අමාත්‍යාංශ උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව අදාළ පාර්ශ්වයන් දැනුවත් කරන ලෙස කාරුණික ව දන්වා සිටිමි.

වටිනාපහ සෝමානන්ද හිමි
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන ලේකම් වෙනුවට

**<u>පිටපත :</u>**

01. ගොනුවට